www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දක්ෂිණාංශික ශ්‍රී ලාංකික නායකයා, කල සේවාවන් වෙනුවෙන් හිටපු වම්මුන්ට තුති පුදයි

## Right-wing Sri Lankan leader thanks ex-lefts for services rendered

විජේ ඩයස් විසිනි
2009 දෙසැම්බර් 11

ශ්‍රී ලංකාවේ විපාර්ශ්වීය එක්සත් ජාතික පක්ෂයේ (එජාප) නායක, රනිල් වික්‍රමසිංහ ගිය සතියේ කල කතාවකින් කම්කරු පන්තිය ප්‍රධාන ධනපති පක්ෂවලට ගැට ගසා එනයින් ධනේශ්වර පාලනයට මුක්කුව දීමෙහි ලා හිටපු මධ්‍යම පන්තික රැඩිකල්වාදීන් ඉටු කල කාර්ය භාරය එලිදරව් කරන අන්තර් ඥානයක් සැපයින. නව සමසමාජ පක්ෂ (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂ (එසප) නායකයන් පසු ගිය වසර පුරා දුන් සහායට සාතිශය තුති පිදූ හේ වත්මන් ජනාධිපතිවරන සටනේ දී ඔවුන්ට සුභ ප්‍රාර්ථනා කලේ ය.

වික්‍රමසිංහ සිටියේ "නිදහසේ වේදිකාව" නමැති ධජය යටතේ දකුනුදිග මාතර නගරයෙහි පැවැත්වුනු ප්‍රසිද්ධ රැස්වීමක් අමතමිනි. එය වනාහි ආන්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මුලුමනින් ම උල්ලංඝනය කිරීම කෙරෙහි මහජනයා තුල වැඩෙන උත්සුකතාව සහ කෝපය ග්‍රහනයට ගනු සහ ගසා කනු පිනිස එජාපය වාත්තු කර ගත් වෛවාරන්නයන්ගේ සන්ධානයකි. ජනවාරි මාසයේ දී ආන්ඩුවට හිත පක්ෂපාතී මැරයන් පෞද්ගලික රූපවාහිනී නාලිකාවක් වන සිරස මාධ්‍ය ආයතනයට පහර දී මහ දවාලේ සන්ඩේ ලීඩර් පුවත්පතේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කර කෙටි කලකට පසුව ය එය අටවා ගනු ලැබුනේ.

දේශපාලනික සහායක් නො ලැබ දක්ෂිණාංශික එජාපයට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරන්නෙකු ලෙස පෙනී සිටිය නොහැකි විය. කෙසේ වෙතත් එජාපය යනු ශ්‍රී ලාංකික ධනපති පන්තියේ සාම්ප්‍රදායික පක්ෂය යි. 1983 දී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිවිල් යුද්ධය ඇරඹූ එය 1994 දී බලයෙන් පහ කෙරෙන තුරු ම අනුකම්පා විරහිත ලෙස අඛන්ඩව යුද්ධය ගෙන ගියේ ය. වෙනත් කෲරකම් අතර, 1980 ගනන්වල අග දී මිලිටරිය සහ එහි සහචර ඝාතක කල්ලි මුදා හැරීමට එජාපය වගකිව යුතු ය. තක්සේරු කොට ඇති පරිදි, එයින් ගම්බද සිංහල තරුනයෝ 60,000කට ආසන්න සංඛ්‍යාවක් ඝාතනයට ලක් වූහ.

එහෙත්, තමන් සමාජවාදීන් යැයි ද ඇතැම් විට ට්‍රොට්ස්කිවාදීන් පවා යැයි ද කියා ගන්නා නසසප සහ එසප මත වාරු වන්නට වික්‍රමසිංහට හැකි විය. එසප "නිදහසේ වේදිකාව" නම් සන්ධානයට නිල වශයෙන් එක් විය. දෙමසකට පසුව එය සමග පැවති නිල සබඳතා අවසන් කල නසසප "ෆැසිස්ට් විරෝධී සන්ධානයට" දුර සිට පරිස්සමෙන් සහාය පිදී ය. එතකුදු වුවත් නසසප නායක වික්‍රමබාහු කරුනාරත්න එජාප මූලස්ථානයෙහි පැවති පුවත්පත් සාකච්ඡාවලට සහභාගි වූ අතර පෙබරවාරියෙහි මහනුවර දී පැවැත්වුනු "විකල්ප නිදහස් දින" රැලියක වේදිකාවෙහි වික්‍රමසිංහ සමග එක් විය.

මෙම අවස්ථාවාදී සන්ධානය විශේෂයෙන් ම විකාරරූපී වූයේ, නසසප සහ එසප ජනාධිපති මහින්ද රාජපක්ෂ ගෙන ගිය සාපරාධී යුද්ධයට තමන් විරුද්ධ යැයි කියාපාන අතරවාරයේ එජාපය යුද්ධයට සහාය දී හමුදාව දෙමල සිවිල් වැසියන් දහස් ගනනක් ඝාතනය කරමින් වග විභාගයක් නැතිව එල්ල කල ෂෙල් වෙඩි ප්‍රහාර ආරක්ෂා කල බැවිනි. එහෙත්, වික්‍රමසිංහ පක්ෂය තුල "ලිබරල් පාර්ශ්වය" නියෝජනය කරන්නේ යැයි ද ඔහුට සහාය දෙනු හැර වෙන විකල්පයක් කම්කරු පන්තියට නැතැයි ද කියාපාමින් නසසප සහ එසප තමන් එජාපයට දුන් සහාය යුක්ති සහගත කලේ ය.

හිටපු රැඩිකල්වාදීන් එජාපයට දුන් සහායේ ප්‍රතිවිපාක දැන් පැහැදිලි ය. මැයි මාසයේ දී යුද්ධය අවසන් වීමෙන් පසුව එලඹි පලාත් සභා මැතිවරන මාලාවක දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) විරුද්ධ පක්ෂ පරාජයට පත් කල අතර රාජපක්ෂ දැන් කලින් ජනාධිපතිවරනයක් කැඳවා ඇත. විකල්ප ප්‍රතිපත්ති හෝ ශක්‍ය ජනාධිපති අපේක්ෂකයෙකු නැති එජාපය සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග එක් වී තම "පොදු අපේක්ෂකයා" ලෙස ජනරාල් සරත් ෆොන්සේකාට සහාය දීමට තීරනය කර ඇත. ඔවුන්ගේ අරමුන වන්නේ, මසකට පෙර සමය තෙක් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හමුදා ජනරාල්වරයාව සිටි ෆොන්සේකා යොදා ගෙන එල්ටීටීඊය පරාජය කල මිනිසා ලෙස රාජපක්ෂ හිමි

කර ගෙන සිටින 'තේජාන්විත' තත්ත්වයට යටි වල කැපීම යි.

නසසප සහ එසප අවස්ථාවාදී උපාමාරු පිලිබඳ දිගු ඉතිහාසයකට උරුමකම් කියන්නේ වුව ද මිලිටරියේ පිටුබලය ලද ඝාතක කල්ලි සිදු කල පුවත්පත් කර්තෘ වික්‍රමතුංග වැනි විවේචකයන් ඝාතනය ඇතුලු යුද අපරාධ සම්බන්ධයෙන් රාජපක්ෂ සමග හවුලේ වගකිව යුතු ජනරාල්වරයකු වන ෆොන්සේකා වැලඳ ගැනීමට යාමක් පමනට වඩා වැඩි නිර්ලජ්ජිත පියවරක් වනු ඇත. එජාප සම්බන්ධයෙන් ගත හොත් නසසප සහ එසප ඒ වන විටත් තමන්ගේ අත්‍යවශ්‍ය දේශපාලන ක්‍රියාකාරිත්වය ඉටු කොට තිබින. එනම්, එජාපයට ප්‍රජාතන්ත්‍රවාදී සලුපිලි ඇන්දවීමෙන් රාජපක්ෂට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් වශයෙන් අභූතරූපී ලෙස ෆොන්සේකා ඉදිරිපත් කිරීමට දැන් වික්‍රමසිංහට හැකියාව ලැබී ඇත.

එජාප — අඩු ගනනේ මේ අවස්ථාවේ — නසසපයෙන් සහ එසපයෙන් ඈත් වී සිටින අතර ඔවුන් සම්බන්ධයෙන් වෛරී හැඟීමක් නැති බව පෙන්වීමට, පසු ගිය සතියේ මාතර දී පැවැත්වුනු රැස්වීමේ දී වික්‍රමසිංහ ප්‍රසිද්ධියේ ඔවුන්ට සිය කෘතඥතාව පල කලේ ය. හේ මෙසේ පහදා දුන්නේ යː "අපි නිදහසේ වේදිකාව ආරම්භ කරද්දි එදා වේදිකාවේ හිටියා වික්‍රමබාහු කරුනාරත්න. එතුමා අමාරු කාලයක ඇවිත් අපට එකතු උනා. අපි ඒක අගය කරනවා. එතුමා අද ජනාධිපති අපේක්ෂකයෙක්. අප සමග දිගටම රැඳි සිටි සිරිතුංග ජයසූරිය මැතිතුමා [එසප නායකයා] නිර්භීත පුද්ගලයෙක්. එතුමා භය නැතිව කතා කලා. එතුමාත් ජනාධිපති අපේක්ෂකයෙක්. මම ඒ දෙන්නටම සුභ ප්‍රාර්ථනා කරනවා."

වික්‍රමසිංහ මෙසේ ද කී යː "අපිට ඕන පිරිසුදු දේශපාලනයක්. වික්‍රමබාහු කරුනාරත්න, සිරිතුංග ජයසූරිය කියන්නෙ මේ රටේ දේශපාලනයේ ඉන්න ඕන අය. ඒ අය ප්‍රජාතන්ත්‍රවාදයට ශක්තියක්. ඒ අය නිර්භීත යි. යහපාලනය පෝෂනය කරන පුද්ගලයන්."

නසසප සහ එසප පිලිබඳව මීට වැඩි ගර්හාත්මක දෝෂාරෝපනයක් තිබිය නොහැකි ය. එය වනාහි දක්ෂිනාංශික ගෝලිස්ට් පක්ෂයේ අපේක්ෂක ජැක් චිරාක් ආ පස්සට හැරී නව ෆැසිස්ට්වාදී ෂෝන් මේරි ල පෙන්ට එරෙහිව 2002 ජනාධිපතිවරන අවසන් වටයේ දී තමන්ට ලබා දුන් නිහඬ සහාය වෙනුවෙන් නානාවිධ ප්‍රන්ස රැඩිකල් පක්ෂවලට ප්‍රසිද්ධියේ තුති පිදීමක් වැනි ය. නැත හොත්, කොන්සර්වැටිව් (තත්ත්වාරක්ෂක) ඕස්ට්‍රේලියානු අගමැති ජෝන් හොවාර්ඩ් තමන් 1999 දී නැගෙනහිර ටිමෝරයෙහි කල මිලිටරිමය මැදිහත් වීම වෙනුවෙන් උද්ඝෝෂනය කල ඕස්ට්‍රේලියානු වාම කන්ඩායම් අගය කලාට සමාන සිදුවීමක් බවට පත් විය හැකි ය. පොදු රීතියක ලෙස, සාමාන්‍ය වැඩ කරන ජනයා ඉදිරියේ මෙම අධම දේශපාලනික සබඳතා හෙලිදරව් වීම වැලැක්වීමට කල හැකි හොඳ ම දෙය වන්නේ එබඳු කෘතගුන සැලකීම් අප්‍රකාශිතව තිබෙන්නට හැරීම බව සම්බන්ධව සිටින සියලු දෙනාට ම වැටහේ.

වික්‍රමසිංහගේ අදහස් දැක්වීම්වලට කරුනාරත්න සහ ජයසූරිය ප්‍රතිචාර දක්වා නැත. ඔවුන් සම්බන්ධ වී සිටින ජාත්‍යන්තර අවස්ථාවාදී සංවිධාන — නසසප සම්බන්ධයෙන් ගත් විට පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලය (යූඑස්එෆ්අයි) සහ එසප සම්බන්ධයෙන් ගත් විට කම්කරු ජාත්‍යන්තරය සඳහා වූ කමිටුව (සීඩබ්ලිව්අයි) — වත් තම ශ්‍රී ලාංකික අනුබද්ධ සංවිධාන විවේචනය කරන්නට හෝ ඒවා විනයගත කරන්නට ඉදිරිපත් වී නැත. නසසප සහ එසප එජාප සමග පවත්වා ගෙන යන නෑකමට සමාන නෑකම් පෘථිවි ගෝලයේ අන් කොටස්වල දී ද දැක ගත හැකි ය. ඒ වනාහි පැබ්ලෝවාදී අවස්ථාවාදයේ විවිධ රූපාකාරයන්හි පරිහානියේ නිෂ්පාදිතය යි.

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) කොටස්කරුවෙකුව සිටින හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව 1953 දී පිහිටුවන ලද්දේ, කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය වෙනුවෙන් මාක්ස්වාදයේ අරගලය ප්‍රතික්ෂේප කරමින් සහ විවිධ රටවල ආනුභාවය පතුරවා ගෙන සිටි ද්‍රෝහී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, ස්ටැලින්වාදී සහ ධනේශ්වර ජාතිකවාදී නායකයන්ට අනුගත වූ මයිකල් පැබ්ලෝගේ සහ අර්නස්ට් මැන්ඩල්ගේ නායකත්වයෙන් හතර වන ජාත්‍යන්තරය තුල පැන නැගී ආ අවස්ථාවාදී ප්‍රවනතාවක් සමග ඇති වූ භේදයේ ප්‍රතිඵලයක් වශයෙනි.

ඉන් අඩ සියවසක් ගෙවුනු තැන, දේශපාලන සංස්ථාපිතය තුල තැනක් සොයා ගන්නට උත්සාහ කරන තතු තුල මෙකී සකලවිධ හිටපු මධ්‍යම පන්තික රැඩිකල්වාදියෝ තමන් "ට්‍රොට්ස්කිවාදීන්" බවට කල කියාපෑම් අත් හැර දමමින් සිටිති. පෙබරවාරියේ දී, පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලයේ ප්‍රන්ස අනුබද්ධ සංවිධානය වන ලීගා කොමියුනිස්ටා රෙවලූෂනරේ (එල්සීආර්) සංවිධානය "නව ප්‍රතිධනවාදී පක්ෂය" (එන්පීඒ) බවට පරිනාමනය වී ගෙන, තමන්ට "ට්‍රොට්ස්කිවාදය සමග නිශ්චිත සබඳතාවක් පිලිබඳ සියලු කියාපෑම්" අතහැර තමන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සහ ස්ටැලින්වාදීන් සමග සන්ධානයන්ට විවෘත "බහුජන සහ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක්" බව තහවුරු කලේ ය.

එජාප සමග ඔවුන් පවත්වන සබඳතා මගින්, නසසප සහ එසප ලොව පුරා සිටින ඔවුන්ගේ සමචින්තකයන් ගමන් කරමින් සිටින දිසාව කුමක් දැයි වඩා පැහැදිලිව පෙන්නුම් කර ඇත. 1977 දී නසසප පිහිටුවනු ලැබුනේ ලංකා සමසමාජ පක්ෂයෙන් භේදවීමෙනි. ඒ ලසසප සිරිමා බන්ඩාරනායක

මැතිනියගේ ශ්‍රීලනිප ආන්ඩුව සමග සභාගයකට එලඹී ට්‍රොට්ස්කිවාදයේ මූලික මූලධර්ම පාවා දී දශකයකටත් වැඩි කලක් ගත වූ පසුවය. නසසප නායකයන් ලසසපයෙන් බිඳී වෙන් වන්නට ඇත. එහෙත් එය එහි අවස්ථාවාදී දේශපාලනයෙන් කිසි දා බිඳී වෙන් වූයේ නැත.

ලසසප මෙන් ම නසසප සහ පසුව එසප ද ශ්‍රීලනිපයට සහ වෙනත් ධනේශ්වර සංවිධානවලට තමන් පිදූ නිහඬ සහාය යුක්ති සහගත කලේ එජාප හා සසඳන කල ඒවා "අඩු නපුර" යැයි ප්‍රකාශ කරමිනි. ඔවුන් එජාපයට අනුගත වන්නට පටන් ගත්තේ වික්‍රමසිංහ ආන්ඩුව එල්ටීටීඊය සමග සටන් විරාමයකට අත්සන් තබා සාම කතාවලට පිවිසුනු 2002 දී ය. නසසප සහ එසප අධිරාජ්‍යවාදී අනුග්‍රහය ලද මෙම "සාම ක්‍රියාවලියට" වමෙන් හුරේ දමන්නන් බවට පත් විය. එහෙත් සාම කතා බිඳ වැටීමෙන් පසුව ද එජාප සමග ඔවුන් පවත්වා ගෙන ගිය සබඳතා අඛන්ඩව පැවතුනු අතර එජාපය ම මේ අවුරුද්දේ දී කියා සිටියේ සටන් විරාමය අලුත් යුද්ධය සඳහා ලකලෑස්ති වීමට හමුදාවට ඉඩ හදා දුන් දක්ෂ උපායක් බව යි.

"නිදහසේ වේදිකාව" පිහිටුවීමෙන් අනතුරුව නසසප නායක කරුනාරත්න කිසි දා නොවූ තරමේ සමීපතාවකින් දක්ෂිනාංශික එජාපයේ අවශ්‍යතාවන්ට තම පක්ෂය අනුගත කලේය. ජුලි 26 වන දා සතිපතා *ලක්බිම නිව්ස්* පුවත්පතෙහි නිතිපතා ලියන සිය තීරු ලිපියෙහි ඔහු කියා සිටියේ, මැතිවරනවල දී නසසප "යන්තමින් වත් සමාජවාදී ඉල්ලීම් වෙනුවෙන් පෙනී නොසිටින" බව යි, එජාප සමග ගැලපෙන පරිදි "නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක්" සහ "ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම්" සඳහා උදසෝෂනය කරන බව යි.

වික්‍රමසිංහ ජනරාල් ෆොන්සේකා වැලඳ ගත් පසුවත් නසසප නායකයා තව මත් එජාපයේ "ලිබරල් පාර්ශ්වය" සමග මැතිවරන සන්ධානයක් ඇති කර ගන්නට චින්තාපරව බලා සිටියේය. ගිය සති අන්තයේ *රාවය* පුවත්පතෙහි පල වූ සම්මුඛ සාකච්ඡාවක දී කරුනාරත්න මෙසේ කියා සිටියේ යඃ "මගේ ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම එක්ක එකඟ වෙන්න පුලුවන් කෙනෙක් ඉන්නව නං මට පුලුවන් ඔහු ගැන [ඔහුට සහාය දෙන එක ගැන] සලකා බලන්න. යම් තරමකට, වික්‍රමසිංහ තමයි පොදු අපේක්ෂකයා බවට පත් වෙන්න සුදුසු පුද්ගලයා."

නොකැමැත්තෙන් වුව ද, ජනාධිපති අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වන්නට කරුනාරත්නට සහ ජයසූරියට බල කෙරී ඇත. මෙම "සමාජවාදීන්ගේ" කේන්ද්‍රීය ප්‍රහාරය යොමු වනු ඇත්තේ කොතැනකට ද යන්න ගැන සසපට කිසිදු මිථ්‍යාවක් නැත. ඒ සසප අපේක්ෂකයා වන විජේ ඩයස්ට සහ කම්කරු පන්තිය මුහුන දෙමින් සිටින වර්තමාන ආර්ථික සහ සාමාජීය ව්‍යසනයට වගකිව යුතු සියලු පාලක පන්තික කන්ඩායම්වලින් — ශ්‍රීලනිපයෙන්, එජාපයෙන් සහ ඔවුන්ගේ නානාවිධ මිත්‍ර පාක්ෂිකයන්ගෙන් — ස්වාධීනව කම්කරු පන්තිය බලමුලු ගැන්වීමේ අප පක්ෂයේ සමාජවාදී ක්‍රියා මාර්ගයට එරෙහිව ය.

© www.wsws.org